# කතුවැකිය

## පරිසර දූෂණයේ අදිසි බලවේග

ඔබත් - මමත් නොදැන සිටි යුගයක මෙම පෘථිවිය මත පරිසර දූෂණය යන වචනයවත් කතාබහට ලක්නොවී තිබූ බව ඔබ නොදන්නවා විය හැකිය. "හුස්ම ගන්නා" වාතය "පය තබන" පස "පානය කරන සහ පිරිසිදු කිරීමට යොදාගන්නා" ජලය "කුසගිනි නිවන" ආහාර ආදී මේ කිසිවක් මිනිසාට සතුරු නොවී ඉතා යහපත්ව ජීවතයට ඉමහත් සේ සමීපව හා සෞඛ්‍යයට මිතුරුව පැවති බව සඳහන් කළ හැකිය. එහෙත් අද ලෝකය තුළ කතාබහට ලක්වන මාතෘකා අතර හිණිපෙත්තෙහිම තිබෙන මාතෘකාවක් වී ඇත්තේ පරිසර දූෂණය යන්නය.

පරිසරය මෙසේ දූෂණය වී ඇත්තේ හදිසියේ හෝ ඉබේටම හෝ නොවේ. එය මිනිසා පරිසර සම්පත් භාවිතයේදී දැක්වූ නොඉවසිලිමත් හා අවිධිමත් තත්වය හා නොසැලකිල්ල නිසා බව හොඳාකාරවම පැහැදිලිය. වාහන පිටාර වායුවෙන් පිටවන අතිවිශාල දූෂක සමූහයට එක්වන කර්මාන්ත ශාලාවලින් නැගෙන දුමාරයද හේතුකොට අප "හුස්ම" ලෙස ආශ්වාස කරන්නේ විෂ වායුන්ගෙන් සමන්විතවූ වාතයය. පානය කරනුයේ හා පරිහරනය කරනුයේ විවිධ විෂ වර්ග කලවම්ව "ගන්ධයක්ද" සහිතව ගලා එන ජලයය. අප පය ගසා සිටිනුයේ විවිධ රසායනික මිශ්‍රවී මිනිසාට පමණක් නොව ශාක - සත්ව ප්‍රජාවන් සියල්ලටම විපත් කැඳවන මහ පොළවක් මතය. එවැනි පසක වගා කරන බව බෝග එම දූෂිත කොටස උපතින්ම රැගෙන එනවා මදිවාට අප ඒවා තවත් විෂ ද්‍රාවණවලින් නහවා ඔපමට්ටම් කර වෙළඳපොළට එවනුයේ අහිංසක මිනිසුන්ගේ මනදොළ සපුරාලන අයුරින් කට බඩ පිරිවීමට වුවත් ඒ හා සමගම මරණීය ව්‍යාධීන් රැසක්ද තමන් "ආහාරය සමග" ශරීරය තුළට ලබාගන්නා බව ඒ අසරණයන් දැන නොසිටින ලෙසත් පෙනේ.

මා මෙතෙක් සඳහන් කළ සියළු දූෂක අදිසි හෝ නොපෙනෙන නිහඬ දූෂක නොවන බව ඔබ පැවසිය හැකිය. එහෙත් මූලික වශයෙන් මෙම දේවල් දූෂණය කිරීමට එදා හවුල් වූ සාධක සමූහය අබිබවා යමින් මිනිසාගේ කාර්මික හා තාක්ෂණික "ජයග්‍රහණ" මධ්‍යයේ පහළ වූ අළුත් දූෂක රාශියක්ද මේ කාර්යය සඳහා දැන් උත්තේජක සැපයීමට සමත්ව ඇත.

එහෙයින් මෙම "විදුරාව" කලාපය විශේෂයෙන්ම කතාබහ කරන විකිරණශීලි දූෂණය, විද්‍යුත් චුම්භක දූෂණය, ආලෝක දූෂණය, ශබ්ද දූෂණය වැනි නවපන්නයේ දූෂක ගණනාවක් අපගේ ආයුකාලය අවම කරමින් අවැඩ සාදන බව කිව යුතුය. මහත් උජාරුවෙන් ඔබ අත තබාගෙන සිටින ජංගම දුරකථන, "ටැබ්" එක පරිසරයට ඇති කරන දූෂණයේ පලවිපාක තවමත් නිසි ලෙස තක්සේරු කර නැතිබව කිව යුතුය. එපමණක් නොව ඔබ අනිසි ලෙස භාවිත කරන ඖෂධ, භාවිතකර විසිකර අවසානයේදී මහා සයුරට එක්වෙන ප්ලාස්ටික් භාජන හා කොටස් මෙන්ම ඔබ අප්‍රියාවෙන් ඉවත දමන කෙළපිඩ පරිසර දූෂණයට දායක වන බව සිත් තබා ගැනීම ඉතා වැදගත්ය.

මෙවර විදුරාව සඟරාව පාඨකයන්ගේ අවධානය යොමුකරනුයේ එදා මෙදා තුර බහුලව කතාබහ කරන දූෂක තත්වයන් ඉක්මවා යන අදිසි දූෂක තත්ව කිහිපයක් ගැනය. කෙසේවෙතත් ඉතා පුළුල් විෂය ක්ෂේත්‍රයත් ලෙස හඳුනාගත හැකි මෙම අදිසි පරිසර දූෂණය ගැන මෙවර මෙන්ම ඉදිරියටත් කතාකිරීමට 'විදුරාව' අදිටන් කරගෙන සිටියි.

තුසිත මලලසේකර